# ඇතුළත් වීමේ මාර්ගෝපදේශය

～අයදුම්කරුවන් සඳහා නියමයන් සහ උපදෙස්～

B කාණ්ඩයේ රටවල් සඳහා


Kyoto Minsai Japanese Language School

〒615-0881 KiyotoShi Ukyo ward NishiKyogoku Kitaoiricho 69

TEL　075-316-0190　　FAX　075-316-0191

E-mail：office@kyotominsai.co.jp　　URL：　http://kyotominsai.co.jp

## I පාඨමාලා දළ සටහන

〈පාඨමාලාව〉 උපාධිය මාර්තු මාසයේදී පැවැත්වේ.

| පාඨමාලාවේ නම | ඇතුලත්වීමේ කාලය | අයදුම් කිරීම් කාලය | පුද්ගලයන් ගණන |
|---|---|---|---|
| අවුරුදු 2 ක පාඨමාලව | 4 වන මාසය | අගෝස්තු 1සිට ඔක්තෝබර් 20 දක්වා | 212කි |
| අවුරුදු 1 යි මාස 9ක පාඨමාලව | 7වන මාසය | නොවැම්බර් 1සිට පෙබරවාරි 20 දක්වා | 187කි |
| අවුරුදු 1 යි මාස 6ක පාඨමාලව | 10වන මාසය | මාර්තු 1 සිට මැයි 10 දක්වා | 60 කි |
| අවුරුදු 1 යි මාස 3ක පාඨමාලව | 1වන මාසය | ජුනි 1සිට සැප්තැම්බර් 10දක්වා | 30 කි |
| අවුරුද්දක පාඨමාලව | 4වන මාසය | අගෝස්තු 1සිට ඔක්තෝබර් 20 දක්වා | 30 කි |

〈රැකියා පාඨමාලාව、ජපන් භාශාව・සංස්කෘතික පාඨමාලාව〉 අවුරුදු 2ක් ඉගෙන ගත හැකිය.

| පාඨමාලාවේ නම | ඇතුලත්වීමේ කාලය | අයදුම් කිරීම් කාලය | පුද්ගලයන් ගණන |
|---|---|---|---|
| වසර 2ක රැකියා පාඨමාලාව | 4වන මාසය | අගෝස්තු 1සිට ඔක්තෝබර් 20 දක්වා | 40 කි |
| වසර 2ක රැකියා පාඨමාලාව | 10වන මාසය | මාර්තු 1 සිට මැයි 10 දක්වා | 40 කි |
| ජපන් භාශාව・සංස්කෘතික අවුරුදු 2ක පාඨමාලාව | 4 වන මාසය | අගෝස්තු 1සිට ඔක්තෝබර් 20 දක්වා | 60 කි |
| ජපන් භාශාව・සංස්කෘතික අවුරුදු 2ක පාඨමාලාව | 7 වන මාසය | නොවැම්බර් 1 සිට පෙබරවාරි 20 දක්වා | 40 කි |
| ජපන් භාශාව・සංස්කෘතික අවුරුදු 2ක පාඨමාලාව | 10 වන මාසය | මාර්තු 1 සිට මැයි 10 දක්වා | 60 කි |
| ජපන් භාශාව・සංස්කෘතික අවුරුදු 2ක පාඨමාලාව | 1 වන මාසය | ජුනි 1 සිට සැප්තැම්බර් 10 දක්වා | 54 කි |

＊එක් එක් පාඨමාලාවට පුද්ගලයන් ගණන ලගා වූ පසු ලියාපදිංචිය අවසන් වේ.

★ පන්ති පැවැත්වෙන කාලය.
සඳුදා සිට සිකුරාදා දක්වා.
උදෑසන 9：20～12：30 සහ 14：00～17：10（පන්තිය ජපන් මට්ටම අනුව තීරණය වේ.）

## II අයදුම් කිරීමේදී අවශ්‍යය සුදුසුකම්.

1 උසස් පෙළ අවසන් කල හෝ ඊට සමාන සුදුසුකමක් ඇති අයෙක් විය යුතුයි.
2 වයස අවුරුදු 17හෝ ඊට වැඩි පුද්ගලයන් විය යුතුයි.
3 CEFRA1 ජපන් භාශා ප්‍රවීණතාවයක් ඇති අය（පාඨමාලාවන්ට අනුව අවශ්‍යය ජපන් මට්ටම වෙනස් වේ. කරුණාකර පාඨමාලා අන්තර්ගතය වෙත යොමු වන්න.）
4 විදේශයන්හි අධ්‍යයාපනය ලබන අතරතුර තම වියදම් දැරීමට හැකියාව ඇති අය.

## III අයදුම් කරන ආකාරය

- ✧ ඔබගේ අයදුම්පත් ලේඛන තැපැලෙන් ඉදිරිපත් කිරීමෙන් පසු ,කරුණාකර බැංකු හුවමාරුව හෝ Flywire හරහා පිරික්සුම් ගාස්තුව ගෙවන්න.
- ✧ ඔබ කෙලින්ම පාසලේදී අයදුම් කරන්නේ නම් කරුණාකර ඔබගේ අයදුම්පත් ලේඛන සහ පිරික්සුම් ගාස්තු පාසල් කවුන්ටරය වෙත ගෙන එන්න.

## IV තෝරා ගැනීමේ ක්‍රමය.

අයදුම්පත් ලේඛන මත පදනම්ව පරීක්ෂණ සහ සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

## අයදුම් පත්‍රයේ සිට ඇතුලත්වීම දක්වා ක්‍රියාපටිපාටිය.

1． අයදුම්පත් ලේඛන ඉදිරිපත් කරන්න, පිරික්සුම් ගාස්තු ගෙවන්න.（අයදුම්කරු）

2． අභයාන්තර ලේඛන පිරික්සීම,සම්මුඛ පරීක්ෂණය,සමත් අසමත් තීරණය.（පාසල）
↓
3． ආගමන කාර්යංශය විසින් විභාග කිරීම.（ආගමන කාර්යංශය）
↓
4． පාසලට සුදුසුකම්ලත් සහතිකය නිකුත් කිරීම.（ආගමන කාර්යංශය）
↓
5． පරීක්ෂණ ප්‍රතිපල ලැබීමෙන් පසු උපකාරක ගාස්තු ගෙවන්න.（අයදුම්කරු）
↓
6． ගෙවීම තහවුරු කිරීමෙන් පසු, සුදුසුකම් සහතිකය සහ ඇතුලත්වීමේ ලිපිය අයදුම්කරුට යවනු ලැබේ.（පාසල）
↓
7． ජපන් තානාපති කාර්යාලයකින් වීසා බලපත්‍රයක් ලබා ගැනීම.（අයදුම්කරු）
↓ ＊වීසා බලපත්‍රයක් ලබා ගැනීමට අයදුම් කිරීමේ සිට මාස 5ක් හෝ මාස 6ක් දක්වා ගත වේ.
8、සංචාරය, පාසලට ඇතුලත් වීම.（අයදුම්කරු）

## V අයදුම්පත් ලේඛන

| අයදුම්කරු ඉදිරිපත් කරන ලද ලේඛන | | |
|---|---|---|
| 1 | අයදුම්පත්‍රය (ORIGINAL)<br>අයදුම්කරු විසින් ඔහුගේ හෝ ඇයගේ අත් අකුරින් අත්සන් කර ඇත.ඔබගේ අධ්‍යයාපනික පසුබිම හෝ සේවා ඉතිහාසයේ හිඩසක් ඇතිනම් සහතිකයක් හෝ පැහැදිලි කිරීමේ ලෙඛනයක් ඉදිරිපත් කරන්න. | |
| 2 | පාසලට අයදුම් කිරීමට හේතුව. (ORIGINAL)<br>කරුණාකර ඔබගේ වර්තමාන තත්වය විදේශයන්හි අධ්‍යයාපනය ලැබීමේ අරමුණ සහ උපාධිය ලැබීමෙන් පසු සැලසුම් විස්තරාත්මකව පැහැදිලි කරන්න.එවිට ජපානයේ ඔබට ඉගෙනීමට ඇති උද්යෝගය අපට තේරුම් ගත හැක. | |
| 3 | උපාධි සහතිකය හෝ උසස් අධ්‍යයාපන සහතික. (ORIGINAL) | |
| 4 | අවසාන අධ්‍යයාපන අස්වීමෙ සහතිකය. (ORIGINAL) | |
| 5 | ජපන් භාශා සහතිකය (ORIGINAL)<br>ජපන් භාශාව ඉගෙනගෙන ඇති කාලය සහ පැය ගණන විස්තර සඳහන් කල යුතුය. | |
| 6 | ජපන් භාශා ප්‍රවීණතා විභාගය සමත් වි ඇති සහතිකය.（ පිටපත්） ＊අදාල පිටපත් පමණි. | |
| 7 | රැකියා සහතිකය (ORIGINAL)<br>අයදුම්කරුට සේවා ඉතිහාසයක් ඇතිනම් ඉදිරිපත් කරන්න.ඔබගේ රැකියා සමාගමේ නම,ලිපිනය සහ දුරකථන අංකය ලැයිස්තු ගත කල යුතුය. | |
| 8 | ඡායාරූප 4ක් ＊4 cm×3 cm＊<br>පසුගිය මාස 3 ඇතුලත ගත් ඡායාරූප විය යුතුය. ඔබේ නම පිටුපස ලියන්න. | |
| 9 | ගමන් බලපත්‍රයේ පිටපත්. | |

| මුල් අනුග්‍රහකයා විසින් ඉදිරිපත් කරන ලද ලියකියවිලි.(sponsor) | | |
|---|---|---|
| 1 | වියදම් ආධාරක ලිපිය ( ORIGINAL) (Letter of agreement regarding payment)<br>අයදුම්කරු සමග ඇති සම්බන්ධය ,මූල්‍යය ආධාරයේ අවශ්‍යතාවය සහ ක්‍රමය යනාදිය පැහැදිලි කරන්න. | |
| 2 | හැඳුනුම්පතේ පිටපත් | |
| 3 | රැකියා සහතිකය ( ORIGINAL)<br>රැකියාව ආරම්භ කර වර්ශය මාසය දිනය,සේවා කාලය,රාජකාරිය යනාදිය සඳහන් කල යුතුය.<br>ඔබ ස්වයං රැකියාවක් කරන්නේනම් ඔබේ ව්‍යාපාර බලපත්‍රය ඉදිරිපත් කරන්න. | |
| 4 | ආදායම් සහතිකය ( ORIGINAL) (පසුගිය වසර සඳහා හෝ වත්මන් ආදයම පෙන්වන පිටපතක්)<br>පළාත් පාලන ආයතනයක් විසින් නිකුත් කරන ලද හෝ ඔබගේ සේවා ස්ථානයේ නිර්මාණය කරඇති。 | |
| 5 | බදු ගෙවීමේ සහතිකය ( ORIGINAL) ( පසුගිය වසර සඳහා හෝ වත්මන් ආදයම පෙන්වන පිටපතක්)<br>පළාත් පාලන ආයතනයක් විසින් නිකුත් කරන ලද හෝ ඔබගේ සේවා ස්ථානයේ නිර්මාණය කරඇති. | |
| 6 | තැන්පතු ශේෂ සහතිකය ( ORIGINAL)<br>යෙන් මිලියන 2ක් හෝ ඊට වැඩි තැන්පතුවක් අවශ්‍යය වේ. | |
| 7 | බැංකු තැන්පත් සහතිකය.<br>පසුගිය වසර සඳහා අරමුදල් තැන්පතුවේ ඉතිහාසය සහ පසුගිය වසර සඳහා තැන්පතු සහ ආපසු ගැනීම් පිළිබඳ පැහැදිලි කිරීම. ප්‍රකාශයේ හෝ පාස්පොතේ පිටපත්. | |
| 8 | ඥාතිත්වය පිලිබඳ සහතිකය ( ORIGINAL) | |
| 9 | ගිවිසුම් සහතිකය ( ORIGINAL)<br>අයදුම්කරු සහ මූල්‍ය අනුග්‍රහයකයා ලේඛන ලිවීම,අත්සන් කිරීම සහ මුද්‍රා තැබිය යුතුය. | |

(ඉදිරිපත් කරන ලද ලෙඛන, අපගේ පාසලේ ප්‍රාදේශීය කාර්‍ය මණ්ඩලය විසින් හෝ දුරකථනයෙන් නැවත පරීක්ෂා කරන ලදි)

<u>**ලේඛන ඉදිරිපත් කිරීමේදී අවධානය යොමුකල යුතු කරුණු.**</u>

ඔබ ඉදිරිපත් කරන ලෙඛන අපගේ පාසල විසින් දැඩි ලෙස සමාලෝචනය කරනු ලැබේ. ලේඛන පිරික්සීමෙන් පසු ඔබ ශිෂ්‍යය වීසා බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍යයි.සුදුසුකම් පිළිබඳ සහතිකයක් නිකුත් කිරීම සඳහා ආගමන කාර්‍යංශයට අයදුම් කරනු ඇත.අපගේ පාසල ඔබ වෙනුවෙන් අයදුම්පත් භාරගනු ඇත.

නීතිවිරෝධීව රැදීසිටීම සහ නීතිවිරෝධී රැකියා වැළැක්වීම සඳහා අප පාසල දැඩි පරීක්ෂණයක් පවත්වයි.ඔබ අයදුම්කලත් සහතිකයක් නිකුත් නොකල හැකි බැවින් අයදුම් කිරීමෙදී පහත කරුණු පරීක්ෂා කිරීමට වග බලා ගන්න

※ලේඛන ලැබීමෙන් පසු අපගේ පාසල සහ ආගමන කාර්යංශය අසම්පූර්ණ බව නිසා අමතර ලියකියවිලි ඉල්ලා සිටිය හැක. එබැවින් කරුණාකර බොහෝ කාලයක් ඉතිරි කර ලේඛන සකස්කර ඉදිරිපත් කරන්න.

※ඉදිරිපත් කරන ලද සියලුම ලේඛන වලට ජපන් පරිවර්තනය අමුණන්න. එසේම කරුණාකර පරිවර්තකයාගේ නම අනුබද්ධය සහ සම්බන්ධතා තොරතුරු පරිවර්තනය කල පෙලෙහි පහැදිලිව සඳහන් කරන්න.

※අභ්‍යන්තර පිරික්සුම් ක්‍රියාවලිය අවසන් වූ පසු මුල් අයදුම්පත් ලේඛන ආගමන කාර්යංශය වෙත ඉදිරිපත් කරනු ලැබේ. එබැවින් ඔබට පිටපතක් අවශ්‍යය නම්.අයදුම් කිරීමට පෙර පිටපතක් සාදන්න.

※අයදුම්කරුවන් තම අයදුම් පත්‍රයේ සියලුම අයිතම තමන් විසින්ම පිරවිය යුතුය. ඒ හා සමානව ,මූල්‍ය ආධාරක පෝරම මූල්‍ය ආධාරකරු විසින් පිරවිය යුතුය. ආදේශක ලිවීමට අවසර නැත.එසේම,ලියාපදිංචි මුද්‍රාවක් භාවිතා කිරීම හෝ අතින් ලිවීමට වග බලා ගන්න.කරුණාකර අත්සන් කරන්න.
මූල්‍ය ආධාරකරු මූලික වශයෙන් දෙමාපියන් වේ.වෙනත් අවස්ථාවලදී කරුණාකර අප හා සම්බන්ධ වන්න.

※ඔබ මීට පෙර දීර්ඝකාලයක් ජපානයේ රැදී සිට ඇත්නම් හෝ සුදුසුකම් පිළිබඳ සහතිකයක් සඳහා ඉල්ලුම් කර ඇත්නම්, කරුණාකර අපට දැනුම් දීමට වගබලා ගන්න.

※කියෝතො මින්සායි ජපන් භශා පාසලේ ලේඛන ජපන් භාශාවට පරිවර්තනය කිරීමද ඇත.
(ඉංග්‍රීසි/චීන සිට ජපන් භාශාවට පරිවර්තන ගාස්තුව : 20,000Yen සිට)

## VI උපකාරක ගාස්තු

■වසර 2ක පාඨමාලාව
■වසර 1යි මාස 9ක පාඨමාලාව
■වසර 1යි මාස 6ක පාඨමාලාව
■වසර 1යි මාස 3ක පාඨමාලාව
■වසර 2 රැකියා පාඨමාලාව
■ජපන් භාෂාව・සංස්තික අවුරුදු 2ක පාඨමාලාව

පළමු වසරේ ගාස්තු. (ඒකකය : ජපන් යෙන්)

| පාඨමාලාවේ පිරිවැය | ගාස්තුව |
|---|---|
| තේරීමේ ගාස්තුව | 33,000Yen |
| ඇතුලත්වීමේ ගාස්තු | 55,000 Yen |
| උපකාරක ගාස්තු | 750,000 Yen |
| පහසුකම් ගාස්තු | 30,000 Yen |
| රක්ෂණ ගාස්තුව | 18,000 Yen |
| බාහිරක්‍රියාකාරකම් වියදම් | 20,000 Yen |
| ※ද්‍රව්‍යය පිරිවැය | 55,000 Yen |
| ජාත්‍යයන්තරශිෂ්‍යය රක්ෂණය | 11,000 Yen |
| විභාග ගාස්තුව | 15,000 Yen |
| බිල්පත් එකතුව | 987,000 Yen |

| පාඨමාලාවේ නම (ඇතුලත් වීමේ කාලය) | වසර 2ක පාඨමාලාව (4 月入学) | වසර 1යි මාස 9ක පාඨමාලාව (ජූලි මාසයේ ලියාපදිංචි විය) | වසර 1යි මාස 6ක පාඨමාලාව (ඔක්තෝබර් මාසයේ ලියාපදිංචි විය) | වසර 1යි මාස 3ක පාඨමාලාව (ජනවාරි මාසයේ ලියාපදිංචි විය) |
|---|---|---|---|---|
| උපකාරක ගාස්තු | 750,000 Yen | 562,500 Yen | 375,000 Yen | 187,500 Yen |
| පහසුකම් ගාස්තු | 30,000 Yen | 22,500 Yen | 15,000 Yen | 7,500 Yen |
| රක්ෂණ ගාස්තු | 18,000 Yen | 13,500 Yen | 9,000 Yen | 4,500 Yen |
| ද්‍රව්‍යය පිරිවැය | 19,000 Yen | 14,250 Yen | 9,500 Yen | 4,750 Yen |
| ශිෂ්‍යය රක්ෂණය | 11,000 Yen | 9,600 Yen | 8,500 Yen | 5,600 Yen |
| බිල්පත් එකතුව | 828,000Yen | 622,350Yen | 417,000Yen | 209,850Yen |

| පාඨමාලාවේ නම (ඇතුළත් වීමේ කාලය) | වසර 2ක රැකියා පාඨමාලාව (අප්‍රේල් ・ ඔක්තෝබර් ඇතුළත් වීම ) ජපන් භාශාව ・ සංස්තික අවුරුදු 2ක පාඨමාලාව (අප්‍රේල් ・ ජූලි ・ ඔක්තෝබර් ・ ජනවාරි ඇතුළත් කිරීම) |
|---|---|
| උපකාරක ගාස්තු | 750, 000 Yen |
| පහසුකම් ගාස්තු | 30, 000 Yen |
| රක්ෂණ ගාස්තු | 18, 000 Yen |
| ද්‍රව්‍යය පිරිවැය | 19, 000 Yen |
| ශිෂ්‍යය රක්ෂණය | 11, 000 Yen |
| බිල්පත් එකතුව | 828, 000 Yen |

■වසර 1ක පාඨමාලාව

(ඒකකය : ජපන් යෙන්)

| පාඨමාලාවේ නම (ඇතුලත් වීමේ කාලය) | වසර 1ක පාඨමාලාව (අප්‍රේල් ඇතුළත් වීම) |
|---|---|
| තේරීමේ ගාස්තුව | 33, 000 Yen |
| ඇතුලත්වීමේගාස්තු | 55, 000 Yen |
| උපකාරක ගාස්තු | 750, 000 Yen |
| පහසුකම් ගාස්තු | 30, 000 Yen |
| රක්ෂණ ගාස්තුව | 18, 000 Yen |
| බාහිරක්‍රියාකාරකම් වියදම් | 20, 000 Yen |
| ※ද්‍රව්‍යය පිරිවැය | 55, 000 Yen |
| ජාත්‍යයන්තරශිෂ්‍යය රක්ෂණය | 11, 000 Yen |
| විභාග ගාස්තුව | 7, 500 Yen |
| බිල්පත් එකතුව | 979, 500 Yen |

※ටැබ්ලට් ඉගැන්වීම් ද්‍රව්‍යය ගාස්තුවට ඇතුළත් වේ.ටැබ්ලට් වෙළදම්ලෙහි වෙනස්වීම් හේතුවෙන් ඉගැන්වීමේ ද්‍රව්‍යය වල මිල වෙනස් විය හැකිය.

・සියලු මුදල එකවර ගෙවීම සඳහා වේ.ඉහත මුදලට 10% පරිභෝජන බද්ද ඇතුළත් වේ.

・එතෙර ප්‍රේෂණ ගාස්තු යවන්නා විසින් දරනු ලැබේ.ගාස්තුව අඩුකර මුදල් එවන්නේ නම් ජපානයට පැමිණි පසු පාසලට රැගෙනවිත් ගෙවිය යුතුය.

## Ⅶ නේවාසිකාගාර ගාස්තු සහ අනෙකුත් වියදම්

| පාසල් නේවාසිකාගාර භාවිතයේදී | |
|---|---|
| නේවාසිකාගාර ගාස්තු | 50,000 |
| ෆුතෝන් ගාස්තුව | 8,000 |
| කුලිය（තනි කාමර） | 40,000～48,000 |
| කුලිය（ශෙයා කාමර） | 20,000～35,000 |

| මාසික ජීවන වියදම සදහා * උදාහරණ* | |
|---|---|
| උපයෝගිතා බිල්පත් | 6,000～ |
| SIM කාඩ්පත් | 3,000～ |
| ආහාර වියදම් | 20,000～ |
| වෙනත් | 10,000～ |
| මුලු වියදම | 39,000～ |

| වෙනත් වියදම් ආදිය | |
|---|---|
| ගුවන්තොටුපොළ බස් වියදම | 2,800～ |
| මුද්‍රාව | 700 |
| බයිසිකලය | 8,000～ |

①ජපානයේදී පදිංචිකරුවන් ජාතික ශාරීරික රක්ෂණයට ලියාපදිංචිවීම අවශ්‍යය වේ. රෝහල්ප්‍රතිකාර ලබාගනීමේදී 70%ක් රක්ෂණයෙන්ද 30%ක් පුද්ගලයා විසින් ගෙවනු ලැබේ.
（ජාතික ශාරීරික රක්ෂණ වාරිකය වසරකට 18,000Yen පමණ වේ.）

②ජාතික ශාරීරික රක්ෂණයට අමතරව ජපානයේ රැඳී සිටින කාලය තුළ විවිධ ගැටලු ආවරණය කිරීම සඳහා සිසුන් ජාත්‍යයන්තර ශිෂ්‍යය රක්ෂණයට බදවා ගැනීම අපේ පාසලට අවශ්‍යය වේ.

③ජපන්භාශා ප්‍රවීණතා විභාග සම්පූර්ණ ගාස්තුව.

අපගේ පාසල、 විශේෂ ඇග්යීම් වලින් එකක් ලෙස 「ජපන් භාශා ප්‍රවීණතා පරීක්ෂණය」 නිර්දේශ කරයි,එබැවින් අපි විභාගය සඳහා සිසුන් දිරිමත් කරන අත,අපි පළමු වසරේ ගාස්තුවට පරීක්ෂණ ගාස්තු දෙක ඇතුළත් ලර ඇත.（වැඩිදුර අධ්‍යයනය සඳහා වසරක පාඨමාලාව සඳහා එක් පරීක්ෂණ ගාස්තුවක්） පාඨමාලාව අවසන් වූ පසු භාවිත නොකළ විභාග ගාස්තු ආපසු ගෙවනු ලබන බව කරුණාවෙන් සලකන්න.

## Ⅷ ශිෂ්‍යයත්වය

ඇතුළත් වී මාස 6කට පසු විශිෂ්ට පැමිණීම් සහ අධ්‍යයන කාර්‍ය සාධනයක් ඇති සිසුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරේ.

１．ස්වාධීන පරිපාලන නියෝජිත ආයතනය ජපාන ශිෂ්‍යය සේවා සංවිධානයේ අධ්‍යයන දිරි දීමනා ගාස්තුව：මසකට 30000Yen（වසර 1）
２．කියෝතෝ මින්සයි ජපන් භාෂා පාසල් ආධාරකරුවන්ගේ සංගමයේ ශිෂ්‍යයත්වය：මසකට20000Yen（වසර 1）
３．කියෝතෝ මින්සයි ජපන් භාෂා පාසල් ශිෂ්‍යයත්වය：මසකට 10000Yen～15000Yen（මාස 6ක්）
４．Kanda senseiශිෂ්‍යයත්වය：මාස 3ක උපකාරක ගාස්තු නිදහස් කිරීම.
※වෙනස් වීමට යටත් මුදල

## IX අන්තර්ගතය

■වසර 2ක පාඨමාලාව
■වසර 1යි මාස 9ක පාඨමාලාව
■වසර 1යි මාස 6ක පාඨමාලාව

| | | |
|---|---|---|
| අරමුණ | | මෙම පාඨමාලාවේ අරමුණ වන්නේ ජපන් භාෂාවේ මූලික කරුණු ඉගෙනීම,විදේශිකයන් සහ ජපන් ජාතිකයන් අතර අන්‍යෝන්‍යය අවබෝධය ජපන් භාෂාවෙන් ඇති කිරීම සහ පාඨමාලාව අවසන් කිරීමෙන් පසු ජපානයේ විශ්ව විද්‍යාලයකට හෝ වෘත්තීය පාසලකට ඇතුළත් වීමට අවශ්‍යය ජපන් භාශාව ලබා ගැනීම,විදේශයන්හී අර්ථවත් අධ්‍යායාපනයක් ලබා ගැනීම සහ අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩ නැගීම. |
| ඉලක්ක මට්ටම | වසර 2ක පාඨමාලාව | හිරගනා කතකනා කියවීමට සහ ලිවීමට ඇති හැකියාව සහ සරල ස්වයං හඳින්වීමක් කිරීමට හැකිවීම. |
| | වසර 1යි මාස 9ක පාඨමාලාව | එදිනෙදා ජීවිතයට අවශ්‍යය සාමාන්‍යය ප්‍රකාශන සහ මූලික වාක්‍ය කණ්ඩතේරුම් ගැනීමට සහ භාවිතා කිරීමට ප්‍රමාණවත් ජපන් භශා හැකියාව . |
| | වසර 1යි මාස 6ක පාඨමාලාව | එදිනෙදා ජීවිතයට අවශ්‍යය නිතර භාවිතා කරන එදිනෙදා ප්‍රකාශන සහ මූලික වාක්‍ය කණ්ඩ ඔබට තේරුම් ගැනීමට සහ භාවිතා කිරීමට හැකි ජපන් භාශා හැකියාව. |
| සපුරාගත් යුතු ඉලක්කය | | උසස් අධ්‍යායාපනයට අයදුම් කිරීමෙදී අවශ්‍යය විශේෂිත ක්ෂේත්‍ර සහ වියුක්ත මාතෘකා අවබෝධ කර ගැනීමට සහ ස්වාභාවික ආදහස් ප්‍රකාශ කිරීමට හැකි වීම ,අන් අය සමග යහපත් සබදතා ගොඩනගමින් ස්වාභාවික අන්තර් ක්‍රියා කිරීමට හැකිවීම.සංකීර්ණ අන්තර්ගතයන් සහිත දිගු පාඨ කියවිය හැකි අතර පැහැදිලි කිරීම් සහ අදහස් ලිවිය හැකි වීම. |

■වසර 1 මාස 3ක පාඨමාලාව

| | |
|---|---|
| අරමුණ | මෙම වැඩසටහනේ අරමුණ වන්නේ ජපනයේ ස්වාධීන භාශා පරිශීලකයෙකු වීමට ජපන් භාශාව ඉගෙනීම ,ජපන් හරහා විදේශිකයන් අතර අන්‍යෝන්‍යය අවබෝධය ජපන් භාශාවෙන් ඇති කිරීම සහ වසර 1යි මාස 3කට පසු ජපානයේ විශ්ව විද්‍යාලයකට හෝ වෘත්තිය පාසලකට ඇතුලත් වීමට අවශ්‍යය ජපන් භාෂාව ඉගෙනීම මෙන්ම විදේශයන්හී අර්ථවත් අධයාපනයක් ලබා ගැනීම සහ අන්තර්පුද්ගල සම්බන්ධතා ගොඩනැගීම. |
| ඉලක්ක මට්ටම | ඔබ විසින්ම හෝ ඔබට සෘජිව සම්බන්ධ ප්‍රදේශ වල නිතර භාවිතා කරන සරල ජපන් භාශාව ඔබට තේරුම් ගැනීමට සහ භාවිතා කිරීමට හැකිතාක් දුරට ජපන් භාශා හැකියාව. |
| සපුරාගත් යුතු ඉලක්කය | උසස් අධයායාපනයට අයදුම් කිරීමෙදී අවශ්‍යය විශේෂිත ක්ශේත්‍ර සහ වියුක්ත මාතෘකා අවබෝධ කර ගැනීමට සහ ස්වාභාවික අදහස් ප්‍රකාශ කිරීමට හැකි වීම,අන අය සමග යහපත් සබදතා ගොඩනගමින් ස්වාභාවිකව අන්තර් ක්‍රියා කිරීමට හැකිවීම.සංකීර්ණ අන්තර්ගතයන් සහිත දිගු පාඨ කියවීමට සහ අදහස් ලිවීමට හැකියාව ඇති වීම. |

■වසර 1 පාඨමාලාව

| | |
|---|---|
| අරමුණ | විවිධ වර්ගයේ සංකීර්ණ සහ උසස් අන්තර්ගතයන්ගෙන් ඉගෙනීම,ජපන් ව්‍යවහරය හරහා විදේශිකයන් සහ ජපන් ජාතිකයන් අතර අවබෝධය ගොඩ නැගීම සහ වසරකට පසු ජපානයේ විශ්ව විද්‍යාල හෝ උපාධිපාසලට ඇතුලත්වීමට අවශ්‍යය ජපන් භාශාව ලබා ගැනීම සහ අර්ථවත් අධ්‍යයනයක්,මානව සබදතා අවශ්‍යය වේ. ඒකාබද්ධ සමාජයක් තුල ස්වාධීනව සහ අඛණ්ඩ පදනමක් මත ජපන් භාෂාව අධ්‍යයනය කරන සහ සහජීවන සමාජයක ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කළ හැකි අන්තර් සංස්කෘතික පුරවැසියන් බවට පත් කරන සිසුන් පෝෂණය කිරීම මෙහි අරමුණයි. |
| ඉලක්ක මට්ටම | විශේෂිත හා වියුක්ත මාතෘකා තේරුම් ගැනීමට සහ ඒවා වාචිකව හා ලිඛිතව ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් ජපන් භාෂා හැකියාව. |

| | |
|---|---|
| සපුරාගත් යුතු ඉලක්කය | උසස් අධ්‍යාපන අධ්‍යයන සහ පර්යේෂණ සඳහා අවශ්‍ය පත්‍රිකා ඇතුළුව උසස්පාඨ සහ දේශන තේරුම් ගැනීමට හැකි වීම, තොරතුරු නිවැරදිව උපුටා ගැනීමට සහ ප්‍රධාන කරුණු සාරාංශ කිරීමට හැකි වීම. විවිධ මාතෘකා පිළිබඳව සහ ලිඛිතව සුදුසු පරිදි අදහස් ප්‍රකාශ කළ හැකිය. විවිධ තත්වයන් සඳහා නිවැරදි වචන තෝරා ගැනීමේ හැකියාව ද ඔවුන්ට ඇත, ස්වාභාවිකව සන්නිවේදනය කළ හැකි අතර, අන් අය සමඟ හොඳ සබඳතා පවත්වා ගනිමින් තමන්ව තහවුරු කර ගත හැකිය. |

■අවුරුදු 2ක රැකියා පාඨමාලාව

| | |
|---|---|
| අරමුණ | මෙම වැඩසටහනේ අරමුණ වන්නේ ජපානයේ රැකියාවක් සොයා ගැනීමට හෝ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ විදේශයන්හි ජපන් සමාගමක සේවය කිරීමට අවශ්‍ය ජපන් භාෂා කුසලතා, ව්‍යාපාර හැකියාව සහ ආචාර විධි ලබා ගැනීම මෙන්ම විදේශයන්හි අර්ථවත් අධ්‍යයනයක් අත්දැකීමට සහ හොඳ සබඳතා ගොඩනඟා ගැනීමට අවශ්‍ය ජපන් භාෂා කුසලතා ලබා ගැනීම සහ ජපානය පිළිබඳ කෙනෙකුගේ අවබෝධය ගැඹුරු කිරීමයි. ජාත්‍යන්තර ප්‍රජාව තුළ සහ සහජීවන සමාජයක ක්‍රියා කළ හැකි ජාත්‍යන්තර පුරවැසියන් ඇති කිරීමේ අරමුණින්, ජපන් භාෂාව හැදෑරීම කෙරෙහි ක්‍රියාශීලී සහ අඛණ්ඩ ආකල්පයක් ඇති කිරීම ද අපගේ අරමුණයි. |
| ඉලක්ක මට්ටම | ඔබේම ක්ෂේත්‍රයේ සහ ඍජු අදාළත්වය ඇති ක්ෂේත්‍රවල බහුලව භාවිතා වන සරල ජපන් භාෂාව තේරුම් ගැනීමට සහ භාවිතා කිරීමට ඔබට ඉඩ සලසන ජපන් භාෂා ප්‍රවීණතා මට්ටමක් ගොඩනැගීම. |
| සපුරාගත් යුතු ඉලක්කය | ජපන් සමාගම් තුළ විවිධ කර්මාන්තවල වැඩ කරන විට ඔබට අන්තර් පුද්ගල සබඳතා ගොඩනගා නැගීමට හැකි වනු ඇත.<br>යෝජනා සහ ඉදිරිපත් කිරීම් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වන විශේෂිත අන්තර්ගතයන් අඩංගු දිගු ලේඛනවලින් තොරතුරු නිවැරදිව උපුටා ගැනීමට සහ ප්‍රධාන කරුණු නිර්මාණාත්මක හා බහුවිධ ආකාරයකින් ලිඛිතව ප්‍රකාශ කිරීමට හැකියාව ඇත.<br>ඊට අමතරව, විවිධ තත්වයන් සඳහා නිවැරදි වචන තෝරා ගැනීමටත් සුදුසු සහ ස්වභාවිකව සන්නිවේදනය කිරීමටත්, අන් අය සමඟ හොඳ සබඳතා පවත්වා ගනිමින් ඔබවම තහවුරු කර ගැනීමටත් ඔබට හැකි වනු ඇත. |

■ජපන් භාෂාව・සංස්කෘතික අවුරුදු 2 පාඨමාලාව

| | |
|---|---|
| අරමුණ | මෙම පාඨමාලාවේ අරමුණ වන්නේ ජපානයේ අර්ථවත් ශිෂ්‍ය ජීවිතයක් ගත කිරීමට සහ අන්අය සමඟ හොඳ සබඳතා ගොඩනඟා ගැනීමට අවශ්‍ය ජපන් භාෂා කුසලතා ලබා ගැනීමට සිසුන්ට උපකාර කිරීම මෙන්ම ජපන් සංස්කෘතිය පිළිබඳ ඉගෙනීම සහ අත්දැකීම තුළින් ජපානය පිළිබඳ ඔවුන්ගේ අවබෝධය ගොඩ නැගීම.ජාත්‍යන්තර ප්‍රජාව තුළ සහ සහජීවන සමාජයක ක්‍රියා කළ හැකි ජාත්‍යන්තර පුරවැසියන් ඇති කිරීමේ අරමුණින් ජපන් භාෂාව හැදෑරීම කෙරෙහි ක්‍රියාශීලී සහ අඛණ්ඩ ආකල්පයක් ඇති කිරීම ද අපගේ අරමුණයි. |
| ඉලක්ක මට්ටම | හිරගනා සහ කතකනා කියවීමට සහ ලිවීමට ප්‍රමාණවත් ජපන් භාෂා කුසලතාවක් තිබීම සහ සරල ස්වයං හැඳින්වීමක් ලබා දීමට හැකි වීම. |
| සපුරාගත් යුතු ඉලක්කය | ජාත්‍යන්තර ප්‍රජාවට අවශ්‍ය විශේෂිත මාතෘකා සහ වියුක්ත මාතෘකා තේරුම් ගැනීමට, තොරතුරු හුවමාරු කර ගැනීමට සහ ස්වභාවිකව අදහස් ප්‍රකාශ කිරීමට සහ අන් අය සමඟ හොඳ සබඳතා ගොඩනඟා ගනිමින් ස්වභාවිකව අන්තර් ක්‍රියා කිරීමට සිසුන්ට හැකි වේ.<br>සංකීර්ණ අන්තර්ගතයන් සහිත දිගුපාඨ කියවීමට සහ පැහැදිලි |

| | |
|---|---|
| | කිරීම් ,අදහස් ලිවීමට හැකියාව ඇත.<br>ජපානයේ විවිධ සංස්කෘතික අත්දැකීම් තුළින්, ජපන් ජනතාව සිතන ආකාරය සහ ඔවුන් අගය කරන දේ ඔබට තේරුම් ගැනීමට හැකි වනු ඇත. |

**X උපකාරක පන්ති ආපසු ගෙවීමේ ප්‍රතිපත්තිය**
**නියම කරයි**

(ඇතුළත් වීමට පෙර)

■සුදුසුකම් සහතිකය නිකුත් කර නොමැති නම්,අයදුම්පත් ගාස්තුව හැර අනෙකුත් සියලුම ගාස්තු ආපසු ගෙවනු ලැබේ.

■සුදුසුකම් සහතිකය නිකුත් කිරීමෙන් පසු,ඔබට: 1) වීසා බලපත්‍රයක් සඳහා අයදුම් නොකරන්නේ නම්, 2) වීසා බලපත්‍රයක් නිකුත් නොකෙරේ නම්, හෝ 3) වීසා බලපත්‍රයක් නිකුත් කර ජපානයට පැමිණීමට පෙර ඔබ පාසලට පැමිණීම අවලංගු කළහොත්,අයදුම්පත් ගාස්තුව සහ ඇතුළත්වීමේ ගාස්තුව හැර අනෙකුත් සියලුම ගාස්තු අපි ආපසු ගෙවන්නෙමු. උපකාරක ගාස්තු ගෙවීමට පෙර ඔබ පාසලට ඇතුලත් වීම අවලංගු කළහොත්, අයදුම්පත් ගාස්තුව සහ ඇතුළත් වීමේ ගාස්තුව ඔබෙන් අය කෙරේ.

(ඇතුලත් වීමෙන් පසු)

■ඇතුළත් වීමෙන් පසු,දැනටමත් ගෙවා ඇති උපකාරක ගාස්තු,පහසුකම් ගාස්තු සහ ජාත්‍යන්තර ශිෂ්‍ය රක්ෂණ වාරිකවල පළමු මාස හය ආපසු ගෙවිය නොහැක. ඔබ මුලින් සැලසුම් කළ කාලයට පෙර ඉවත් වුවහොත්,පහත ක්‍රියාවලියට අනුව ගණනය කරන ලද ඔබ ඇතුළත් වූ පළමු මාස හය සඳහා අපි ඔබේ උපකාරක ගාස්තු,පහසුකම් ගාස්තු සහ ජාත්‍යන්තර ශිෂ්‍ය රක්ෂණ වාරික (ඒවා මුලින්ම ගෙවා ඇති බැවින් ආපසු ගෙවිය නොහැක) ආපසු ගෙවනු ලැබුවත්, 33,000Yen ක අවලංගු කිරීමේ ගාස්තුවක් අය කෙරේ. ආපසු ගෙවීමේ මුදල අවලංගු කිරීමේ ගාස්තුවට වඩා අඩු නම්, එය පියවනු නොලැබේ.

① උපකාරක පන්ති සහ පහසුකම් ගාස්තු මාස තුනක කාණ්ඩ යටතේ ආපසු ගෙවනු ලැබේ.

・මාස 3ක උපකාරක ගාස්තුව : (2023 7වන මාසයට පෙර) මාස 3ක 171, 600 Yen (10% බදුඇතුළුව) (2023 10වන මාසයට පසු)මාස 3ක 187, 500Yen (10% බදුඇතුළුව)

・පහසුකම් ගාස්තුව: (2023 7වන මාසයට පෙර) මාස 3ක් සඳහා 6, 600 Yen (10% බදුඇතුළුව) (2023 10වන මාසයට පසු) මාස 3ක් සඳහා 7, 500 Yen (10% බදුඇතුළුව)

②ජාතික සෞඛ්‍ය රක්ෂණ ගාස්තු, පෙළපොත් ගාස්තු, විභාග ගාස්තු සහ විෂය බාහිර ක්‍රියාකාරකම් ගාස්තු පහත ගණනය කිරීමේ ක්‍රමය මත පදනම්ව ආපසු ගෙවනු ලැබේ.

・ජාතික සෞඛ්‍ය රක්ෂණ වාරික: නගර සභාවට දැනටමත් ගෙවා ඇති මුදල (ගෙවිය යුතු මුදල ඇතුළුව) හැර මුදල් ආපසු ගෙවනු ලැබේ.

・ද්‍රව්‍ය ගාස්තුව: බෙදා හරින ලද පෙළපොත්වල පිරිවැය සහ පිටපත් කිරීමේ ගාස්තු අඩු කිරීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ (මසකට 1, 000Yen)

・විභාග ගාස්තුව: අයදුම්පත් ගාස්තුව හැර ආපසු ගෙවනු ලැබේ.

・විෂය බාහිර ක්‍රියාකාරකම් ගාස්තුව: ඔබ සහභාගී නොවන්නේ නම් ආපසු ගෙවනු ලැබේ (කෙසේ වෙතත්,අවලංගු කිරීමේ අවසාන දිනය ඉක්මවා ඇත්නම් මුදල් ආපසු ගෙවනු නොලැබේ)

・ජාත්‍යන්තර ශිෂ්‍ය රක්ෂණය: මුදල් ආපසු ගෙවීමක් නැත.

■ඔබගේ රැඳී සිටීමේ කාලය දීර්ඝ කිරීම සඳහා වන අයදුම්පත ප්‍රතික්ෂේප වී ඔබ විද්‍යාලයෙන් පිටව ගොස් ඔබේ මව් රටට ආපසු ගියහොත්, මුදල් ආපසු ගෙවනු නොලැබේ. කෙසේ වෙතත්,ඉතිරි උපකාරක පන්ති ගෙවීම් ශේෂය මාස 3ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා ගෙවීමට තිබේ නම්, මුදල් ආපසු ගෙවීම ඉහත ක්‍රමයට අනුව ගණනය කෙරේ.

■අධ්‍යයන වාරය තුළ ඔබ ඔබේ වීසා තත්ත්වය ශිෂ්‍ය තත්වය හැර මධ්‍ය කාලීන හෝ දිගු කාලීන වීසා බලපත්‍රයකට (උදා: ජපන් ජාතිකයෙකුගේ කලත්‍රයා හෝ දරුවා, පවුලේ නවාතැන්, දිගුකාලීන පදිංචිකරු ආදිය) වෙනස් කර පාසලෙන් ඉවත් වුවහොත් සහ ඔබේ ඇතුළත් වීමේ කාලය වසරකට වඩා අඩු නම්, ඉහත ගණනය කිරීමේ ක්‍රමයට අනුව ඔබට මුදල් ආපසු ගෙවනු ලබන අතර, පරිපාලන අවලංගු කිරීමේ ගාස්තුවක් අය කෙරේ. කෙසේ වෙතත්,ඉතිරි ශේෂය ගාස්තු මුදලට වඩා අඩු නම්, කිසිදු ගාස්තුවක් අය නොකෙරේ. ඔබ ලියාපදිංචි වී වසරක් හෝ ඊට වැඩි කාලයක් ගත වූ පසු ඔබේ වීසා තත්ත්වය වෙනස් කළහොත්, වෙනස් වූ දිනය ඇතුළුව මාසය දක්වා උපකාරක පන්ති සහ පහසුකම් ගාස්තු හැර, අපි ඔබට සමානුපාතික පදනමක් මත මුදල් ආපසු ගෙවන්නෙමු. අවලංගු කිරීමේ ගාස්තුවක් නොමැත.

■නීතිරෙගුලාසි හෝ පාසල් නීති උල්ලංඝනය කිරීම හේතුවෙන් ඔබව නෙරපා හරිනු ලැබුවහොත් මුදල් ආපසු ලබා නොදෙනු ඇත.

■ප්‍රතිපත්තිමය වශයෙන්, ජපානයට නැවත පැමිණීම තහවුරු කිරීමෙන් හෝ පදිංචි තත්ත්වය වෙනස් කිරීමෙන් පසු මාසයක් ඇතුළත විදේශීය හෝ දේශීය ගිණුමකට මුදල් ආපසු ගෙවනු ලැබේ. මුදල් ආපසු ගෙවීම සම්බන්ධයෙන් දරන ඕනෑම ප්‍රේෂණ ගාස්තුවක් ලබන්නා විසින් දරනු ලබන බව කරුණාවෙන් සලකන්න.

## <u>XI නේවාසිකාගාර ගාස්තු ආපසු ගෙවීමේ ප්‍රතිපත්තිය</u>

1. ඔබ ජපානයට පැමිණීමට පෙර ඔබගේ නේවාසිකාගාර වෙන්කිරීම අවලංගු කළහොත්, අපි ඔබගේ ගෙවීම මාසයක කුලිය අඩු කර ආපසු ගෙවන්නෙමු.
2. ජපානයට පැමිණීමෙන් පසුව නමුත් කාමරය භාවිතා කිරීමට පෙර ඔබ ඔබේ නේවාසිකාගාරයේ නවාතැන් අවලංගු කළහොත්, මාස දෙකක කුලිය හැර අනෙකුත් සියලුම මුදල් අපි ඔබට ආපසු ගෙවන්නෙමු.
3. ඔබ ජපානයට පැමිණ කාමරය භාවිතා කිරීමෙන් පසු ඔබේ නවාතැන අවලංගු කළහොත්, ඇතුල්වීමේ ගාස්තුව සහ මාස දෙකක කුලිය හැර අනෙකුත් සියලුම මුදල් අපි ඔබට ආපසු ගෙවන්නෙමු.
4. ඔබ නේවාසිකාගාරයෙන් පදිංචියට ගොස් මාස හයක් ඇතුළත පිටව ගියහොත්, ඔබ පාසල් කාර්යාලයට පිටව යාමට අදහස් කරන බව දැනුම් දුන් දිනට පසු මාසය දක්වා නේවාසිකාගාර ගාස්තු හැර, ඉතිරි ශේෂය ආපසු ගෙවනු ලැබේ.